අහෝ දෙවියනි, මාගේ මිනීවළ ස්මාරකයක්

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: "අහෝ දෙවියනි, මාගේ මිනීවළ ස්මාරකයක් බවට පත් නොකරන්න. තම නබිවරුන්ගේ මිනීවලවල් දේවස්ථාන බවට පත් කරගත් පිරිසට අල්ලාහ් ශාප කළේය."
[صحيح] [رواه أحمد]

ගරුබුහුමන් කරමින් හා සිරස නමන්නට දිශාවක් බවට පත් කර ගනිමින් මිනිසුන් නමදින පිළිම මෙන් තමන්ගේ මිනීවල පත් නොකරන මෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තම පරමාධිපතිගෙන් ප්රාර්ථනා කර සිටියහ. පසුව කවරෙකු නබිවරුන්ගේ මිනීවලවල් දේවස්ථාන බවට පත් කර ගත්තේ ද ඔවුන් ඔහුගේ කරුණාවෙන් දුරස් වන බවත් නෙරපා හරින බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. සැබැවින්ම ඒවා දේවස්ථාන බවට පත් කර ගනිමින් ඒවායෙහි නැමදුම් කිරීම හා ඒවා මත විශ්වාස කිරීම පහත් කටයුතු අතරින් වන බැවිනි.

http://www.sunnah.global/hadeeth/si/show/3336